# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2293/25 - 2022 අගෝස්තු මස 17 වැනි බදාදා - 2022.08.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1878(X)(ඈ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින් 1972 අංක 15 දරන ලංකා රසායන විද්‍යා ආයතන පනත යටතේ පිහිටුවන ලද ආයතනයක් වන ඉන්ස්ටිටියුට් ඔෆ් කෙමිස්ට්‍රි, සිලෝන් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන්, හා 2020 මාර්තු 11 වැනි දින අංක 2166/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් එකී ආයතනය, උසස් අධ්‍යාපන වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා රසායනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය ප්‍රදානය කිරීම සඳහා යොමු කරන්නා වූ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනු ලැබීමෙන් පසුව, එකී නියමයේ I වන උපලේඛනයේ නියම කර ඇති කොන්දේසිවලට යටත්ව, එකී I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති (3) වන කොන්දේසිවලට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොන්දේසි ඇතුළත් කිරීම මගින් එකී නියමය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''4. ඉන්ස්ටිටියුට් ඔෆ් කෙමිස්ට්‍රි සිලෝන් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධියට අදාළ උපාධි පාඨමාලාව සඳහා රසායන විද්‍යාව පිළිබඳ උපාධි වැඩසටහනේ (GIC) පාර්ශ්වීය ප්‍රවේශය මගින් සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, -

(අ) රසායන විද්‍යාව පිළිබඳ උපාධි වැඩසටහනේ (GIC) I වන මට්ටම හා 2 වන මට්ටම සඳහා, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ජීව විද්‍යාව හෝ භෞතික විද්‍යාව විෂය ධාරාවෙන්, විෂයයක් වශයෙන් රසායන විද්‍යාව ඇතුළුව, ''සාමාන්‍ය සාමාර්ථ'' ("S") තුනක් එකවර ලබා තිබීම හෝ ඊට සමාන සුදුසුකමක් ලබා තිබිය යුතු අතර, ඉන්ස්ටිටියුට් ඔෆ් කෙමිස්ට්‍රි සිලෝන් ආයතනයේ අධ්‍යාපනික අංශය (CCS) විසින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය සමත්ව තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකමට අනුකූලව කටයුතු කළ යුතු ය;

(ආ) රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියේ 2 වන මට්ටම සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, -

(i) රසායාන විද්‍යාව පිළිබඳ උපාධි වැඩසටහනේ (GIC) 1 වන මට්ටමේ දී පිරිනමනු ලබන අනිවාර්ය රසායන විද්‍යා පාඨමාලා ඒකකවල (න්‍යායාත්මක සහ ප්‍රායෝගික) අධ්‍යයන සම්භාර 12ක් සඳහා ''සම්මාන සාමාර්ථ'' ("C") සමග අවම සමුච්චිත GPA අගය 4.0 ක පරිමාණයකින් 2.5 ක අගයක් ලබා තිබීම; සහ

(ii) රසායන විද්‍යාව පිළිබඳ උපාධි වැඩසටහනේ (GIC) 1 වන මට්ටමේ දී පිරිනමනු ලබන සියලුම වර්ධක පාඨමාලා ඒකක සඳහා අවම GPA අගය 4.0 ක පරිමාණයකින් 2.0 ක අගයක් ලබා තිබීම,

ඇතුළුව, රසායන විද්‍යාව පිළිබඳ උපාධි වැඩසටහනේ (GIC) 1 වන මට්ටම එකවර සාර්ථක ලෙස අවසන් කර තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකමට අනුකූලව කටයුතු කළ යුතු ය;

(ඇ) රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියේ 3 වන මට්ටම සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, -

(i) රසායන විද්‍යාව පිළිබඳ උපාධි වැඩසටහනේ (GIC) 1 වන මට්ටමේ දී සහ 2 වන මට්ටමේ දී පිරිනමනු ලබන අනිවාර්ය රසායන විද්‍යා පාඨමාලා ඒකකවල (න්‍යායාත්මක සහ ප්‍රායෝගික) අධ්‍යයන සම්භාර 24ක් සඳහා ''සම්මාන සාමාර්ථ'' ("C") සමග අවම සමුච්චිත GPA අගය 4.0 ක පරිමාණයකින් 2.5 ක අගයක් ලබා තිබීම; සහ

(ii) රසායන විද්‍යාව පිළිබඳ උපාධි වැඩසටහනේ (GIC) 1 වන මට්ටමේ දී සහ 2 වන මට්ටමේ දී පිරිනමනු ලබන සියලු ම වර්ධක පාඨමාලා ඒකක සඳහා අවම GPA අගය 4.0 ක පරිමාණයකින් 2.0 ක අගයක් ලබා තිබීම,

ඇතුළුව, රසායන විද්‍යාව පිළිබඳ උපාධි වැඩසටහනේ (GIC) 2 වන මට්ටම එකවර සාර්ථක ලෙස අවසන් කර තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකමට අනුකූලව කටයුතු කළ යුතු ය;

(ඈ) රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියේ 4 වන මට්ටම සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී -

(i) අවම වශයෙන් රසායන විද්‍යාව සඳහා අධ්‍යයන සම්භාර 72ක් සහිතව අධ්‍යයන සම්භාර 120ක් අවම වශයෙන් සම්පූර්ණ කර තිබීම, සහ

(ii) 3 වන මට්ටමේ දී සහ 4 වන මට්ටමේදී රසායන විද්‍යාව සඳහා පාඨමාලා ඒකක අවම අධ්‍යයන සම්භාර 42ක් සහ ව්‍යවහාරික කළමනාකරණය (APM) සඳහා අවම අධ්‍යයන සම්භාර 6ක් සම්පූර්ණ කර තිබීම.

ඇතුළුව, රසායන විද්‍යාව පිළිබඳ උපාධි වැඩසටහනේ (GIC) 3 වන මට්ටම හෝ 4 වන මට්ටම එකවර සාර්ථක ලෙස අවසන් කර තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකමට අනුකූලව කටයුතු කළ යුතු ය.

5. රසායන විද්‍යාව පිළිබඳ උපාධි වැඩසටහනේ (GIC) 1 වන මට්ටම හෝ 2 වන මට්ටමින් රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා පාර්ශ්වීය වශයෙන් ඇතුළත් වූ සියලුම සිසුන් විසින් රසායනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය ප්‍රදානය කරනු ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා රසායනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය අවසානයේ දී ව්‍යවහාරික කළමනාකරණ පාඨමාලාවේ (APM), අධ්‍යයන සම්භාර 24 ක අවශ්‍යතාව සම්පූර්ණ කළ යුතු ය.

6. රසායන විද්‍යාව පිළිබඳ උපාධි වැඩසටහන (GIC) සඳහා වර්ෂ 2020 දී හෝ ඉන්පසුව ලියාපදිංචි වූ යම් සිසුවකුට, රසායන විද්‍යාව පිළිබඳ උපාධි වැඩසටහනේ (GIC) 3 වන මට්ටමේ සිට 4 වන මට්ටම දක්වා පාර්ශ්වීය ප්‍රවේශය පිරිනැමීම සඳහා ඉන්ස්ටිටියුට් ඔෆ් කෙමිස්ට්‍රි, සිලෝන් ආයතනයට අවසර දෙනු නොලැබේ.”

ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත (පා. ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2022 අගෝස්තු මස 08 වැනි දින,
කොළඹ දී ය.

EOG 08-0139/1

එල්.ඩී.බී. 21/1978(X)(බී)

## 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

### 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත කර ඇති, ලියාපදිංචි අංක පී. වී. 94112 දරන, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන සමාගමක් වන, ඊසොෆ්ට් මෙට්‍රො කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වන වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2021 මැයි මස 20 වැනි දින අංක 2228/30 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි 1 වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන ''ව්‍යාපාර කළමනාකරණ (ගෞරව) උපාධිය'' යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි යටතේ නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

1 වන උපලේඛනය

*කොන්දේසි*

1. ඊසොෆ්ට් මෙට්‍රො කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ගෞරව උපාධිය (එස්එල්කිවුඑෆ් 5 වන ස්ථරය) සම්බන්ධයෙන් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී -

    (අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී වාණිජ්‍ය විෂයය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම; හෝ

    (ආ) නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද එයට ඇඳුනු පාඨමාලාවක් සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම,

    යන ඇතුළත් කරගැනීමේ අවම සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා ඊසොෆ්ට් මෙට්‍රො කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබිය යුතු ය.

II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ව්‍යාපාර කළමනාකරණ උපාධිය | බී බී එම් |

ආචාර්ය **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා. ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2022 අගෝස්තු මස 08 වැනි දින,
කොළඹ දී ය.

EOG 08-0139/2

එල්.ඩී.බී. 21/1878(X)(ආ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1)(ආ) වගන්තිය සමග කියවිය යුතු 25අ වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 (1) (ආ) වගන්තිය සමග කියවිය යුතු 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, ආචාර්ය ජී. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන, ලියාපදිංචි අංක ජී. එල්. 24 දරන, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2022 මාර්තු මස 30 වැනි දින අංක 2273/44 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ II වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන, ''සමාජ විද්‍යාව පිළිබඳ අධ්‍යාපනවේ දී ගෞරව'' යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත් ව එකතු කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

**1 වන උපලේඛනය**

**කොන්දේසි**

ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය විසින්. මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධි වැඩසටහන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී-

(i) පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් -

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතික විද්‍යා විෂය ධාරාව, ජීව විද්‍යා විෂය ධාරාව හෝ තාක්ෂණවේදය විෂය ධාරාව යන විෂය ධාරාවන්ගෙන් ''සාමාන්‍ය සාමාර්ථ'' ("S") තුනක් (3) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක්, හෝ

(ආ) නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද එයට ඇඳුනු පාඨමාලාවක් සමග අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂය ධාරාවක් යටතේ ''සාමාන්‍ය සාමාර්ථ'' ("S") තුනක් (3) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම ලබා තිබීම යන්නට,

අනුකූල විය යුතු ය.

(ii) තොරතුරු තාක්ෂණය පිළිබඳව අධ්‍යාපනවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන්, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂය ධාරාවක් යටතේ ''සාමාන්‍ය සාමාර්ථ'' ("S") තුනක් (3) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූල විය යුතු ය.

II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*(උපාධිය සඳහා වන කෙටි යෙදුම )* |
|---|---|
| පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (පරිගණක විද්‍යාව) |
| තොරතුරු තාක්ෂණය පිළිබඳව අධ්‍යාපනවේදී ගෞරව | බීඊඩී ගෞරව (තොරතුරු තාක්ෂණය) |

ආචාර්ය ජී. ඩී. සුසිල් ප්‍රේමජයන්ත (පා. ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2022 අගෝස්තු මස 12 වැනි දින,
කොළඹ දී ය.

EOG 08-0139/3

එල්.ඩී.බී. 21/1978(X)(බී)

## 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

### 25අ වන වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සහ ලියාපදිංචි අංක පී. වී. 72548 දරන, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන සමාගමක් වන සීජීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වන වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2022 පෙබරවාරි මස 25 වැනි දින අංක 2268/88 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන ''තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව'' යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

#### 1 වන උපලේඛනය

#### කොන්දේසි

1. සීජීස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයය ධාරාවකින් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (03) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම හෝ ඊට සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා සීජීස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබේ.

#### II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ඉංග්‍රීසි පිළිබඳ ශාස්ත්‍රවේදී | බීඒ (ඉංග්‍රීසි) |

ආචාර්ය **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා. ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2022 අගෝස්තු මස 12 වැනි දින,
කොළඹ දී ය.

EOG 08-0139/4

එල්.ඩී.බී. 21/1978(X)(බී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වන වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, මේ නියමය මගින්, සීගීස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනත යටතේ සාදන ලද සහ 2022 පෙබරවාරි මස 25 වැනි දින අංක 2268/88 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනය, එහි II වන තීරයේ උපාධි සඳහා වන කෙටි යෙදුම් ශීර්ෂය යටතේ ඇති 3 වන පේළියේ සඳහන් ''බීඑස්සී ගෞරව (පරිගණක විද්‍යාව)'' යන කෙටි යෙදුම වෙනුවට පහත දැක්වෙන කෙටි යෙදුම ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :

''බීඑස්සී ගෞරව (තොරතුරු තාක්ෂණය)''

ආචාර්ය **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා. ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2022 අගෝස්තු මස 12 වැනි දින,
කොළඹ දී ය.

EOG 08-0139/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.